සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 9 - 2019

නම : .............................................. පුරවැසි අධ්‍යාපනය කාලය : පැය 02 යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.**

(1) යහපත් ලෙස කටයුතු කරන විනයගරුක පුද්ගලයෙකු සමාජයට දායාද කිරීමේ ප්‍රමුඛතම වගකීම ..................................................... සතු වේ. (පවුල/ පාසැල/ සමාජය)

(2) රාජ්‍යයක හෝ සමාජයක සියලු දෙනාම අවනත විය යුතු රාජ්‍ය විසින් පනවනු ලබන සමස්ථ රෙගුලාසි පද්ධතිය ..................................................... ලෙස සරලව හැඳින්විය හැකිය. (නීති/ රීති/ සිරිත්විරිත්)

(3) මද්‍යසාර, මත්ද්‍රව්‍ය වැනි විවිධ සමාජ විරෝධී ක්‍රියා මැඩපැවැත්වීම වැරදිකරුවන් නීතියේ රැහැනට හසුකර දීම ..................................................... ප්‍රධාන කාර්යයයි. (අධිකරණයේ/ ත්‍රිවිධ හමුදාවේ/ පොලිසියේ)

(4) ජනතාව අතර ඇතිවන සුළු ආරවුල් අධිකරණය වෙත නොගොස් නිරාකරණය කිරීම සඳහා පිහිටුවා ඇති විකල්ප ආයතන විශේෂය ..................................................... නමින් හඳුන්වයි. (ග්‍රාම නිළධාරි කාර්යාලය/ සමථ මණ්ඩලය/ දිසා අධිකරණය)

(5) කිසියම් ස්ථානයක ළමා හිංසනයක්, ළමා අපචාරයක් සිදුවන විට එය වළක්වා ගැනීම සඳහා ..................................................... යන සෘජු දුරකථන අංකය අමතා දැනුම්දිය හැකිය. (1919/ 1929/ 119)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) පර්යේෂණයක් ලෙස හැඳින්වෙන්නේ විද්‍යාත්මක ක්‍රමවේද අනුගමනය කරමින් ගැටළුවක් පිළිබඳ ව විසඳුම් සොයා ගැනීමට කෙරෙන අධ්‍යයනයකි. (     )

(7) තිරසර සංවර්ධනය යනු අනාගත පරපුරේ අවශ්‍යතා සඳහා පවතින සම්පත් ඉතිරි කරමින්, වර්තමාන සම්පත්වලින් උපරිම ඵල ලබාගනිමින්, පරිසරය පිළිබඳව අවම අවධානයක් යොමු කරමින් සිදුකරන සංවර්ධනයයි. (     )

(8) නව තාක්ෂණික සොයා ගැනීම් නිසා ආර්ථිකයේ දැවැන්ත වෙනසක් සිදුවී ඇත. නාගරීකරණය යනු ඒ අතරින් සිදු වූ ධනාත්මක වෙනසයි. (     )

(9) අන් අයට කරදරයක් නොවන අයුරින් නීත්‍යානුකූල මාර්ගවලින් ධනය උපයාගෙන ධාර්මිකව ජීවත්වීම සහජීවනයයි. (     )

(10) හිස නවා ආචාර කිරීම, කිමෝනාව ඇඳීම, සුමෝ ක්‍රීඩාව, මළවුන් ඇදහීම ජපාන සංස්කෘතියේ අංග කිහිපයකි. (     )

● **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු හිස්තැන් මත ලියන්න.**




ඉහත රූපයේ දැක්වෙන්නේ මුදල් ණයට ලබාගත හැකි ණය කාඩ්පත් (Credit Card) ක්‍රමයයි. මෙම ක්‍රමය මුදල් එහා මෙහා ගෙන යා හැකි වඩාත් (11) ............................................................ ක්‍රමවේදයක් ලෙස වත්මන් සමාජයේ දක්නට ඇත. මෙම කාඩ්පත් උපයෝගී කරගෙන අපට ඕනෑම (12) ............................................................ වර්ගයකින් ගණුදෙනු කළ හැකිය. එසේම යම්කිසි කාලසීමාවක් සඳහා (13) ............................................................ රහිත ගෙවීම් කාලයක් ද ඔබට හිමි වේ. එසේ වුව ද මෙම ක්‍රමයේ අවාසි රාශියක් ද දක්නට ඇත. සීමාවකින් තොරව භාණ්ඩ හා සේවා ලබාගැනීම නිසා අපිට විඳිය නොහැකි ආකාරයට මෙම කාඩ්පත් අයිති සමාගම්වල දිගුකාලීන (14) ............................................................ කරුවන් බවට පත්වීමට සිදුවේ. එසේම මුදල් සඳහා ඉතා ඉහළ (15) ............................................................ අනුපාතයක් ද අය කරනු ලැබේ.

● **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) ''ප්‍රජාතන්ත්‍රවාදය සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි.'' යනුවෙන් ප්‍රකාශ කළේ කවු ද? පිළිතුරු අතරින් තෝරන්න.

1. ඒබ්‍රහම් ලින්කන් 2. සීලර් 3. ගැනර් 4. ඇරිස්ටෝටල්

(17) රැකියා වෙළෙඳපොළෙහි ඇති වූ නව ප්‍රවණතා සමඟ ඇති වූ නව පන්නයේ රැකියාවක් වන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. ජාන තාක්‍ෂණික ශිල්පීන් 2. නවීන වඩු කාර්මික ශිල්පීන්
3. වාහන අලුත්වැඩියා ශිල්පීන් 4. මැටි ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන්

(18) රටක ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීම කෙරෙහි බලපාන සාධකයක් වන්නේ කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. තරඟකාරී පක්‍ෂ ක්‍රමයක් පැවතීම.
2. රට මැතිවරණ කොට්ඨාශවලට බෙදා තිබීම.
3. සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම.
4. ජනතාවගේ දේශපාලන දැනුම ඉතා ඉහළ මට්ටමක පැවතීම.

(19) ඈත අතීතයේ දී පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූයේ කුමන රාජ්‍යයේ දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. රෝමයේ ය. 2. ඉන්දියාවේ වජ්ජ ජනපදයේ ය.
3. ශ්‍රී ලංකාවේ රාජ සභාවල ය. 4. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ය.

(20) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකමක් වන්නේ, කුමක්දැයි පිළිතුරු අතරින් තෝරන්න.

1. හොඳින් අධ්‍යාපන කටයුතු කරගෙන යාම. 2. පරිසරය පිරිසිදුව තබා ගැනීම.
3. තමන් කැමති ආගමක් ඇදහීම. 4. ජාතික සමඟිය වර්ධනය කිරීම.


(ලකුණු $02 \times 20 = 40$)

# II කොටස


- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. (i) සමාජයට ඉමහත් මෙහෙයක් සිදුකළ පුද්ගලයන් හතර දෙනෙකුගේ පින්තූර ABCD අක්ෂර වලින් දක්වා ඇත. ඔවුන් හඳුනාගෙන නම් කරන්න.

A




B



C



D



.............................................. .......................................... ................................................ ................................................

(ලකුණු 04)

(ii) පහත ආදර්ශ පාඨ කුමන ආයතනවලට අයත් වන්නේදැයි තිත් ඉරි මත ලියන්න.

1. ''රට වට බැඳි රන් වැට'' ..........................................................................................................
2. ධර්මයේ හැසිරෙන්නා ධර්මයෙන්ම රැකේ ..........................................................................................................
3. එකා සැමටත් සැම එකාටත් ..........................................................................................................
4. පීතෘ භූමිය සඳහා ..........................................................................................................

(ලකුණු 04)

(iii) ඔබට හිමිවන අයිතිවාසිකම් 04ක් පහත ABCD වලින් දක්වා ඇත. ඒ හා සම්බන්ධයෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

A. අධ්‍යාපනය ලැබීමේ අයිතිය ..........................................................................................................
B. ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ..........................................................................................................
C. තමන් කැමති දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලැබීමේ අයිතිය ..........................................................................................................
D. තමන් කැමති ආගමක් ඇදහීමේ අයිතිය ..........................................................................................................

(ලකුණු 04)

(iv) 1. ගැටුම් ශුභවාදීව නිරාකරණය කර නොගැනීම නිසා ඇතිවන ප්‍රතිවිපාක 02ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

2. කැපී පෙනෙන ජීව දත්ත පත්‍රිකාවක් සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු 02ක් ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 04) (4 × 4 = 16)

02. (i) ශ්‍රී ලංකාවේ මුලින්ම ආරම්භ කළ මහනගර සභා තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පළාත් පාලන ආයතනවලින් ඉටු කරනු ලබන සේවා 02ක් ලියන්න. (ලකුණු 02)

(iii) පහතින් දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සභාවක සැකැස්මයි. එහි හිස්තැන්වලට අදාළ පිළිතුර තිත් ඉරි මත ලියන්න.

**ප්‍රාදේශීය සභාව**

1. ........................................................

2. ........................................................

මහජන නියෝජිතයන්

3. ........................................................

රාජ්‍ය නිලධාරීන්

4. ........................................................

5. ........................................................

6. ........................................................

(ලකුණු 06)

03. (i) වෘත්තීය ජීවිතය හා පෞද්ගලික ජීවිතය සමබරව පවත්වා ගැනීමේ දී ඔබ විසින් නොකළ යුතු දේවල් 03ක් ලියන්න. (ලකුණු 03)

(ii) පුද්ගලයෙකුගේ දෛනික ජීවිතය ඔහු කරනු ලබන කාර්යයන් අනුව ප්‍රධාන කොටස් පහකට වර්ග කළ හැකිය. එම කොටස් පහට අනුව කරනු ලබන කාර්යයන් නිවැරැදිව හඳුනාගෙන ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.

| | | |
|---|---|---|
| 1. | වෘත්තියට අදාළ කාර්යයන් | උදා : පුහුණුවීම්වලට යොමු වීම.<br>1. ........................................................ |
| 2. | පෞද්ගලික ජීවිතයට අදාළ කාර්යයන් | 2. ........................................................ |
| 3. | පවුල් ජීවිතයට අදාළ කාර්යයන් | 3. ........................................................ |
| 4. | සමාජ ජීවිතයට අදාළ කාර්යයන් | 4. ........................................................ |
| 5. | ආධ්‍යාත්මික ජීවිතයට අදාළ කාර්යයන් | 5. ........................................................ |

(ලකුණු 05)

(iii) පෞද්ගලික මූල්‍ය කළමනාකරණයේ දී අනාගතය සඳහා ඉතිරි කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ ඉතිරි කිරීම් අවශ්‍ය වන අවස්ථා 03ක් ලියන්න. (ලකුණු 03)

04. (i) ගැටුමක් යන්න ඔබගේ අදහස්වලට අනුව හඳුන්වා දෙන්න. (ලකුණු 02)

(ii) පහත ABC යටතේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.

A. ගැටුමට මුල් වී ඇති පාර්ශව ගැටුම සමථයකට පත්කර ගැනීම සඳහා එකඟ නොවන විට නඩු විභාගයකින් ගැටුම නිරාකරණයට එළැඹීම හඳුන්වන්නේ කුමන නමකින් ද?

B. ගැටුමට සම්බන්ධ පාර්ශව දෙකටම ජය ජය විසඳුම් ගෙන එන ගැටුම් නිරාකරණය කිරීමේ සරළ ම ක්‍රමය මේ නමින් හඳුන්වයි.

C. විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මඟපෙන්වීම ලබාදෙමින් ගැටුම් නිරාකරණයට යොමුවීම මේ නමින් හඳුන්වයි. (ලකුණු 03)

(iii) ලෝකයේ දක්නට ඇති විවිධ ගැටුම් වර්ගවලට උදාහරණ පහතින් දක්වා ඇත. උදාහරණවලට අදාළව ගැටුම් හඳුනාගෙන ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

1. ඉන්දියාව හා පාකිස්ථානය අතර කාෂ්මීර ප්‍රදේශය සම්බන්ධ ගැටුම
2. උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර ගැටුම

→ X

3. ඉරාකය හා ඉරානය අතර ඛණිජ තෙල් සඳහා පැවතුන ගැටුම
4. ඇමරිකාව හා චීනය අතර වෙළෙඳාම සඳහා පවතින ගැටුම

→ Y

5. ඉන්දියාවේ හින්දුවරුන් හා මුස්ලිම්වරුන් අතර ගැටුම
6. රුවන්ඩාවේ හුටු හා ටුට්සි ගෝත්‍ර අතර ගැටුම

→ Z

(ලකුණු 06)

05. (i) පහත දී ඇති රැකියා නිවැරැදිව වගුවේ දක්වා ඇති රැකියා ක්ෂෙත්‍රවලට ඇතුළත් කරන්න.

- ගුරුවරුන්
- කුලී රථ සේවා
- ආයතන ප්‍රධානීන්
- ව්‍යාපාර කටයුතු
- කම්කරුවන්
- ව්‍යාපාර හිමිකරුවන්

| රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා | සේවායෝජක රැකියා | ස්වයං රැකියා |
|---|---|---|
| 1. ............................................ | 3. ............................................ | 5. ............................................ |
| 2. ............................................ | 4. ............................................ | 6. ............................................ |

(ලකුණු 06)

(ii) පහත ABC රූපවල දක්වා ඇත්තේ ස්ථානීය රැකියා වර්ග තුනකි. ඒවා හඳුනාගෙන නම් කරන්න.

A


B


C


(ලකුණු 03)

(iii) ඔබගේ පෞද්ගලික ගොනුවක ඇතුළත් විය යුතු වැදගත් තොරතුරු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

06. (i) රැකියා දැන්වීමක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රධාන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) පහත XYZ රූප තුනේ ඇත්තේ සම්මුඛ පරීක්ෂණ පවත්වන ආකාර තුනකි. ඒවා හඳුනාගෙන ලියන්න.

X


Y


Z


(ලකුණු 03)

(iii) පහත සඳහන් වගන්ති කාල කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය අනුව වර්ග කර වගුවට ඇතුළත් කරන්න.

1. සේවාලාභීන් තෘප්තිමත් කළ හැකිවීම.
2. සම්පත් අපතේ යාම වළක්වා ගත හැකි වීම.
3. වැඩ ප්‍රමාදවීමක් සිදු නොවීම.
4. අනාගතය සඳහා ඉතිරි කිරීම.
5. පරිභෝජනය කිරීම සඳහා ණයට ගැනීමෙන් වැළකීම.
6. බැංකු ගිණුමක් පවත්වාගෙන යාම.

| කාල කළමනාකරණයට | මූල්‍ය කළමනාකරණයට |
|---|---|
| 1. ................................................................ | 1. ................................................................ |
| 2. ................................................................ | 2. ................................................................ |
| 3. ................................................................ | 3. ................................................................ |

(ලකුණු 06)


07. (i) දී ඇති උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

*හරහට*

1. කලා විෂය ධාරාවෙන් ඉගෙනුම ලබන අයෙකුට වුව ද යා හැකි නීතිය හා සම්බන්ධ ආයතනයකි.
2. රැකියාවක් සඳහා ඉල්ලුම් කරන විට මෙය අත්‍යවශ්‍ය වේ.
3. ඕනෑම රැකියාවක් කිරීමෙන් රැකියා ලාභියා මෙය බලාපොරොත්තු වේ.
4. විද්‍යා විෂය ධාරාව හදාරන අයට පමණක් ඉල්ලුම් කළ හැකි මෙම රැකියාවේ පුහුණුව රෝහල්වලට සම්බන්ධ වේ.
5. රියදුරු රැකියාවක් කරන අයකු සිය වාහනය මෙසේ කළ යුතුම ය.
6. සේවාව සපයන්නා යන අර්ථය ගනී.
7. වෘත්තිය පුහුණුව ලැබූ පසු අපට මෙය අනිවාර්යයෙන්ම ලැබේ.
8. තමන්ගේ තොරතුරු ඇතුළත් පත්‍රිකාවකට මේ නම භාවිත කරයි.

*පහළට*

9. විශේෂයෙන්ම තාක්ෂණික විෂය ධාරාවෙන් අධ්‍යාපනය හදාරන තරුණයන් කැමති රැකියාවකි. යන්ත්‍ර සමඟ සම්බන්ධ වේ.
10. පාවිච්චියට ගන්නවා යන අර්ථ ගනී.
11. ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතනයකි.



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019
# Third Term Test - Grade 9 - 2019

## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

## I කොටස

01. පවුලේ
02. නීති
03. පොලිසියේ
04. සමථ මණ්ඩලය
05. 1919
06. (✓)
07. (✗)
08. (✗)
09. (✗)
10. (✓)
11. පහසු/ ආරක්ෂාකාරී
12. මුදල්
13. පොලී
14. ණය
15. පොලී
16. (2)
17. (1)
18. (4)
19. (4)
20. (4)

## II කොටස

(01) (i) A. ඒබ්‍රහම් ලින්කන්
B. තෝමස් අල්වා එඩිසන්
C. මර්සලින් ජයකොඩි පියතුමා
D. මහත්මා ගාන්ධි තුමා

(ii) 1. ශ්‍රී ලංකා නාවික හමුදාව
2. ශ්‍රී ලංකා පොලිසිය
3. සමුපකාර ව්‍යාපාරය
4. ශ්‍රී ලංකා යුධ හමුදාව

(iii) A. හොඳින් අධ්‍යාපනය ලැබීම.
B. මැතිවරණ නීති රීතිවලට අවනත වීම.
C. ජය පරාජය සමව භුක්ති විඳීම/ අන් අයගේ මතයට ද ගරු කිරීම.
D. අනිකුත් ආගම්වලට අගෞරව නොකිරීම.

(iv) 1.
- මානසික ආතතිය
- අපකීර්තියට පත්වීම.
- සම්පත් විනාශ වීම.

2.
- අවශ්‍ය කරුණු නිවැරදිව හා පැහැදිලිව ඉදිරිපත් කිරීම.
- පැහැදිලි ඡායාරූප ඇතුළත් කිරීම.
- විශේෂ දක්ෂතා කුසලතා පිළිබඳව සටහන් කිරීම
- පිරිසිදු බව

(ආදී වශයෙන්) (පිටුව 137)

02. (i)
- කොළඹ මහ නගර සභාව
- ගාල්ල මහ නගර සභාව
- මහනුවර මහ නගර සභාව

(ii)
- පුස්තකාල සේවාව
- ළමා උද්‍යාන
- පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- ප්‍රාදේශීය මාර්ග නඩත්තුව
- සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා
- කසළ කළමනාකරණය

(ආදී වශයෙන්) (පිටුව 101, 102, 103)

(v) 1. සභාපති
2. උප සභාපති
3. ප්‍රාදේශීය සභා මන්ත්‍රීන්
4. රාජ්‍ය නිලධාරින්
5. ලේකම්
6. අනෙකුත් නිලධාරින්

03. (i)
- මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම.
- දුම්බීමෙන් වැළකීම.
- නරක මිතුරන් ඇසුරු කිරීමෙන් වැළකීම.
- සමාජ විරෝධී කටයුතුවල නොයෙදීම.

(පිටුව 157)

(ii) 1.
- ලිපි ලේඛන සැකසීම.
- රැස්වීම්වලට සහභාගි වීම.
- රැකියාව හා සම්බන්ධ කටයුතු

2.
- නෑදෑ හිත මිතුරන් හමුවීම.
- වැඩිදුර අධ්‍යාපනය
- පෞද්ගලික ස්වස්ථතාව පවත්වාගෙන යාම.

3.
- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු
- විනෝද චාරිකා යාම.
- ගෙදර දොර අලුත්වැඩියාව
- ආහාර සැකසීම.

4.
- ප්‍රදේශයේ සමිති සමාගම්වලට සහභාගි වීම.

- පොදු සේවා සඳහා උදව් වීම.
- ආගමික කටයුතුවලට දායක වීම.

5. 
- ආධ්‍යාත්මික ගුණ වගාව දියුණු කරගැනීමට කටයුතු කිරීම.
- ආගමික කටයුතු ධර්මානුකූල ජීවිතයකට යොමු වීම.

(iii)
- තවදුරටත් මුදල් ඉපයීමට නොහැකි වීම.
- හදිසි කරදර ඇති වුවහොත්, එවැනි අවස්ථාවල ප්‍රයෝජනයට ගැනීමට
- වයස්ගත වූ විට හෝ විශ්‍රාම ගිය විට ප්‍රයෝජනයට ගැනීම.
- අන්‍යයන්ට කරදර නොවන සේ ජීවත් වීමට හෝ ගැළපෙන පිළිතුරුවලට ලකුණු දෙන්න.

04. (i)
- ගැටුමක් යනු, ''ප්‍රචණ්ඩ හැප්පීමක්, අරගලයක් හො හරඹයක්, මානසික වශයෙන් සිදුවන අරගලයක් හෝ ගැළපෙන පිළිතුරකට ලකුණු දෙන්න.

(ii) A. විනිසීම
B. සාකච්ඡා කිරීම.
C. උපදේශනය

(iii) X. දේශපාලන මුල මත ඇතිවන ගැටුම්
Y. ආර්ථික මුල මත ඇතිවන ගැටුම්
Z. සමාජ මුල මත ඇතිවන ගැටුම්

05. (i) රාජ්‍ය හා පෞද්ගලික අංශ 1. ගුරුවරුන්
2. කම්කරුවන්
සේවා යෝජක 3. ආයතන ප්‍රධානින්
4. ව්‍යාපාර හිමිකරුවන්
ස්වයං රැකියා 5. කුලී රථ සේවා
6. ව්‍යාපාර කටයුතු

(ii) A. ගෘහස්ථ රැකියා
B. එළිමහනේ කරන රැකියා
C. ජංගම රැකියා

(iii)
- පෞද්ගලික තොරතුරු
- පෞද්ගලික ගුණාංග
- පෞද්ගලික කුසලතා
- පෞද්ගලික චර්යා
- පාසැලේ දී ලබාගත් අත්දැකීම්

06. (i)
- ජීව දත්ත පත්‍රිකාවක් මගින්
- රැකියා ඉල්ලුම් පත්‍රයක් මගින්
- ලිපියක් මගින්

(ii) X. තනි පුද්ගලයකු විසින් කරනු ලබන
Y. මණ්ඩලයක් මගින් කරනු ලබන
Z. නිපුණතා මැන බැලීමේ පරීක්ෂණ

(iii)

| කාල කළමනාකරණය | මූල්‍ය කළමනාකරණය |
|---|---|
| • සේවාලාභීන් තෘප්තිමත් කළ හැකි වීම. | • අනාගතය සඳහා ඉතිරි කිරීම. |
| • වැඩ ප්‍රමාද වීමක් සිදු නොවීම. | • පරිභෝජනය සඳහා ණයට ගැනීමෙන් වැළකීම. |
| • සම්පත් අපතේ යාම වැළකීම. | • බැංකු ගිණුමක් පවත්වා ගෙන යාම. |

07. *හරහට*
1. නීති විද්‍යාලය
2. අයදුම්පත
3. වැටුප
4. හෙද පුහුණුව
5. නඩත්තු
6. සේවායෝජක
7. සහතික
8. ජීව දත්ත

*පහළට*
9. යන්ත්‍ර අලුත්වැඩියාව
10. පරිභෝජන
11. තරුණ සේවා සභාව